...තය / ...மைச்சர் / ...nister } 2326732

...කම / ...யலாளர் / ...retary } 2399735 / 2399673


මගේ අංකය / எனது இல / My No } PL/13/IA/3/8/COPA

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2017.05.18

# පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
# மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
# Ministry of Provincial Councils and Local Government


330, යූනියන් පෙදෙස, කොළඹ 02./ 330, யூனியன் பிளேஸ், கொழும்பு 02 / 330, Union Place, Colombo 02


අභ්‍යන්තර විගණන නියෝග අංක 02/ 2017

සියළුම ප්‍රධාන ලේකම්වරුන් වෙත,

**<u>පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම් කාරක සභා උපදෙස් ක්‍රියාත්මක කිරීම.</u>**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ඒ ඒ පළාත් සභා සහ පළාත් පාලන ආයතන සම්බන්ධව විගණකාධිපතිවරයා සිදු කර ඇති විමර්ශන වලට අදාලව තව දුරටත් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු කරුණු සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස මා වෙත උපදෙස් දී ඇත. එහිදී කාරක සභාව විසින් පොදුවේ නිරීක්ෂණය කරන ලද පහත සඳහන් කරුණු කෙරේ ඔබගේ කාරුණික අවධානය මෙයින් යොමු කරන අතර මේ පිළිබඳව සියළු ආයතන ප්‍රධානීන් දැනුවත් කරන මෙන්ද එම කරුණු පිළිබඳ නිරන්තර පසු විපරමක් විගණන කළමනාකරණ කමිටු වලදී සිදු කරන ලෙසද කාරුණිකව දන්වා සිටිමි.

1. පළාත් සභා සහ සියළුම පළාත් පාලන ආයතන විසින් වාර්ෂික අවසාන ගිණුම් නියමිත දිනයන්ට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
2. විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කිරීම සහ පිළිතුරු නොදුන් විගණන විමසුම් සඳහා පිළිතුරු යැවීම.
3. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අඛණ්ඩව පැවැත්වීම. මෙහිදී ආදායම් උපයන දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වාර්ෂිකව අවම වශයෙන් රැස්වීම් 06 ක්ද අනෙකුත් ආයතන වාර්ෂිකව අවම වශයෙන් රැස්වීම් 04 ක්ද බැගින් පැවැත්වීම අවශ්‍යයි.
4. 2014.02.17 දිනැති අංක 01/2014 දරණ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අනුමත කිරීම හා ඒවාට අනුකූලව ක්‍රියාත්මක කිරීම.
5. සියළුම වර්ගවල බදු ආදායම් රැස් කිරීමට අදාල නියමිත වාර්තා පවත්වාගෙන යාම. තව දුරටත් ආදායම් රැස්කර ගත හැකි මාර්ග පිළිබඳ සැලකිලිමත් වීම හා එම ආදායම් රැස් කිරීම. (දුරකථන කුළුණු, නාම පුවරු, ඉඩම් කට්ටි කර විකිණීමේ ආදායම් වැනි)
6. මධ්‍යම පරිසර අධිකාරිය මඟින් බලය පවරා ඇති කර්මාන්ත සඳහා පරිසර බලපත්‍ර වසර 03කට වරක් සංශෝධනය කිරීම.

7. විදේශ සංචාර සඳහා අරමුදල් භාවිතය සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්, සියළුම ගරු ආණ්ඩුකාරවරු, සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරු අමතා ඇති ජනාධිපති ලේකම්ගේ අංක සීඑස්ඒ/1/4 හා 2017.01.26 දිනැති චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කිරීම.

8. සියළුම පළාත් සභා සහ පළාත් පාලන ආයතන සතු ආදායම් නිවැරදිව පුරෝකථනය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් යෙදීම.

එච්.ටී.කමල් පත්මසිරි,
ලේකම්,
පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

පිටපත් :- 1 ලේකම් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව , - දැ.ගැ.පි.